# අවලෝකිතේශ්වර බෝධිසත්වයන්ගේ වැදගත්කම හඳුනාගැනීම

**ටී. ජී. ජී. තලවත්ත**

**කථිකාචාර්ය (ඉතිහාසය) මානව ශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය**
ajiththalwatte@gmail.com

## හැඳින්වීම

මෙම පර්යේෂණය "අවලෝකිතේශ්වර බෝධිසත්වයන්ගේ වැදගත්කම හඳුනාගැනීම" යන මාතෘකාව මත පදනම් ව සිදුකරන අධ්‍යයනයක් වශයෙන් සඳහන් කළ හැකි ය. මහායාන බුදුදහම තුළ අවධානයට ලක්වන ප්‍රධාන ලක්ෂණයක් නම් බෝධිසත්ව වන්දනාවයි. මෙරට ඇති වූ මහායානික බලපෑම නිසා බෝධිසත්ව ඇදහීම ප්‍රචලිත විය. එකී දහමට අනුව බෝධිසත්ව සංකල්පය හඳුනාගන්නේ කෙසේ ද යන්න සොයා බැලිය යුතු ය. මහායානයට අනුව සෑම මහායානිකයෙක් ම බෝධිසත්වයෙකි. චතුර්විධ මාර්ග ඥානය ද සර්වඥතා ඥානය ද බෝධි නම් වෙයි. ක්‍රි.පූ. දෙවන ශතවර්ෂයෙහි පමණ භාරතයේ ආරම්භ වූ සේ සලකා බෝධිසත්ව සංකල්පය ඊට ආසන්න කාලයේ ම ශ්‍රී ලංකාවට ලැබෙන්නට ඇතැයි සිතිය හැකි බවට සමහර වියතුන්ගේ මතයයි. බෝධිසත්වරුන්ගේ කොටස් දෙකකි. එනම් පාලි බුදුසමයෙහි බෝධිසත්වවරුන්ට මානුෂි බෝධිසත්වයන් ලෙස ද මහායානයේ ඉගැන්වෙන සම්භෝගකාය හා සම්බන්ධ බෝධිසත්වයන් ධ්‍යානි බෝධිසත්වයන් ලෙස හැඳින්වේ. මෙරට විවිධ පාලකයන්ගේ අනුග්‍රහය මත වර්ධනය වන බෝධිසත්ව වන්දනය පිළිබඳ පුරාවිද්‍යාත්මක සාධක හමුවනුයේ හතරවන හෝ අටවන සියවසේ දී බව විද්වතුනගේ මතය වේ. එකල බෝධිසත්ව සංකල්පය මහාවිහාරයත්, අභයගිරියත් භේදයකින් තොරව පිළිගන්නා ලදී. බුද්ධ හා බෝසත් වන්දනාව සමාන තත්ත්වයට පත්වී ජනප්‍රිය විය. අවලෝකිතේශ්වර නැමැති සංගෘහිත පදය අවලෝකිත, ඊශ්වර යන වචන දෙක ඒකාබද්ධව සෑදී තිබේ. අවලෝකන ඊශ්වර යන සංස්කෘත පද දෙක සම්බන්ධවීමෙන් අවලෝකිතේශ්වර සෑදී ඇති බවට උගතුන් පෙන්වා ඇත. අවලෝකිතේශ්වර යන්නෙහි අර්ථය වන්නේ සෑම තැනම දක්නට ලැබෙන අධිපති, බලාවදාරණ අධිපති, කාරුණික බැලුම් හෙළන අධිපති සහ දකින උතුමා යනාදිය වේ. සිංහල කලාකරුවා සුවිශේෂී අවලෝකිතේශ්වර ප්‍රතිමා රැසක් ද නිර්මාණය කිරීමට සමත්වීම කැපීපෙනේ.

## පර්යේෂණයේ අරමුණු

අවලෝකිතේශ්වර බෝධිසත්වයන්ගේ වැදගත්කම හඳුනාගැනීම යන මාතෘකාවේ ප්‍රධාන අරමුණු කිහිපයක් මත පදනම් ව කටයුතු කිරීමට අපෙක්ෂිතය. මහායාන බුදුදහම තුළ අවධානයට ලක්වන ප්‍රධාන ලක්ෂණයක් ලෙස බෝධිසත්ව වන්දනයේ ප්‍රබවය හඳුනාගෙන, එය කෙසේ මෙරට තුළ ස්ථාපිත වූයේ ද, මහායානය තුළින් වර්ධනය වූ අවලෝකිතේශ්වර සංකල්පය විකාශනයවීම, එම බෝධිසත්වයන් අසුරෙන් නිරූපිත ප්‍රතිමා කලාව අධ්‍යයනය කර, අවලෝකිතේශ්වර නාථ මහනුවර යුගයේ දී නාථ දෙවියන් මෛත්‍රී බෝධිසත්වයන් හා බද්ධ ව එක දෙවි කෙනෙකු ලෙස පෙනී සිටියේ කෙසේ යන්න විමර්ශනය කිරීම පර්යේෂණයේ අරමුණු වේ.

## පර්යේෂණ ක්‍රමවේදය

අවලෝකිතේශ්වර බෝධිසත්වයන්ගේ වැදගත්කම හඳුනාගැනීම යන ශාස්ත්‍රීය පර්යේෂණය සිදුකිරීමේ දී තොරතුරු ලබාගැනීම පිණිස අනුගමනය කරන පර්යේෂණ ක්‍රම වේදය හා මූලාශ්‍ර ද ඉතා වැදගත් වේ. මේ සඳහා අවශ්‍ය දත්ත ලබා

ගැනීමේ දී පුස්තකාල හා ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ඇති ලේඛන ද යොදා ගැනීමට ද අපේක්ෂිත ය. තොරතුරු ලබාගැනීමේ දී ප්‍රාථමික හා ද්විතීක මූලාශ්‍ර යොදාගන්නා අතර ජනශ්‍රැති කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරේ.

## විමර්ශනය

බෝධිසත්වයන් පිළිබඳ අදහස ආරම්භවී භාරතය හා ඒ ආසන්න රටවල ද ව්‍යාප්ත වූ බව පෙනේ. බෝධිසත්ව සංකල්පය විකාශය සමඟ අවලෝකිතේශ්වර හා මෛත්‍රී යන බෝධිසත්වයන් එකල බෞද්ධ දේශන හා සමාජ සංකල්පය තුළට අන්තර්ග්‍රහණය වී 14 වන සියවසේ සිට 17 වන සියවස දක්වා සිදු විය. මහායාන බෝධිසත්ව මණ්ඩලයේ වැදගත් ස්ථානයක් හිමිකර ගන්නා අවලෝකිතේශ්වර ඉතා ජනප්‍රිය බෝසතුන් ද වේ. ඒ අනුව හත්වන සියවසේ සිට මෙරට බෞද්ධයන් අතර ගෞරව බහුමානයට පාත්‍ර වූ අවලෝකිතේශ්වර බෝසතුන් අවලෝකිතේශ්වර නාථ, ලෝකේශ්වර නාථ හෝ නාථ නමින් දේවත්වයට පත්වූ බව පෙනේ. මහනුවර යුගයේ දී නාථ දෙවියන් මෛත්‍රී බෝධිසත්වයන් හා බද්ධව එක දෙවි කෙනෙකු ලෙස පෙනී සිටීම ද කැපී පෙනේ. ලෞකික අරමුණුවලින් බැහැරව ලෝකෝත්තර අපෙක්ෂා ඉටුකර දෙන දෙවියෙකු ලෙස උන්වහන්සේ පත්ව ඇත.

## ආශ්‍රෙය ග්‍රන්ථ


නිකාය සංග්‍රහය, 1997. සංස්. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, මැදිවල, දෙහිවෙල.

මහාවංශය, 1912, සංස්.හික්කඩුවේ සුමංගලාභිධාන හිමි, සහ දොන් අන්ද්‍රිස් බටුවන්තුඩාවේ, පරි. ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, කොළඹ.

සමන්තපාසාදිකා, 1929, සංස්. පියරතන මහාස්ථවිර සහ සෝරත ස්ථවර හේවාවිතාරණ මුද්‍රණාලය, කොළඹ.

සිංහල කතිකාවත් සහ භික්ෂු සමාජය, 1972, සංස්. ඒ.වී. සුරවීර, ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, කොළඹ.

ඉලංගසිංහ, මංගල, මධ්‍යකාලීන ලංකාවේ ආගම, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2005.

සාසනරතන, මොරටුවේ, 1952, ලක්දිව මහායාන අදහස්, විසිදුන ප්‍රකාශන,කොළඹ.

හෝල්ට්, ජෝන්, ක්ලිෆර්ඩ්, 1991, මකුට මුනිධාරී අවලෝකිතේශ්වර නාථ ලංකා පුරාණය, පරි. පී.බී.මීගස්කුඹුර ප්‍රදීප ප්‍රකාශන, කොළඹ.

Mudiyanse,Nandasena,1965,Mahayana Monuments in Ceylon, M .D .Gunasena and Co. Colombo.